වැසි වනාන්තර සුරකින්නෝ

http://www.RainforestProtectors.org
RainforestProtectors@Gmail.com
65 - 1/1 Hotel Road, Mt. Lavinia
Tel: 0773486568

30/07/2015

පරිසර අමාත්‍යාංශය

මධ්‍යම පරිසර අධිකාරිය

## <u>ශ්‍රී ලංකාවට ආවේනික හොර ගස ආරක්ෂිත ශාඛයක් ලෙස නීති ගත කිරීම</u>

ශ්‍රී ලංකාවට ආවේනික හොර ගස (*Dipterocarpus zeylanicus)* IUCN රතු දත්ත පොතට අනුව දැඩි ලෙස වඳවී යාමේ තර්ජනයකට මුහුණ පා ඇති ශාඛයකි[1]. දිනෙන් දින විනාශ වී යන වැසි වනාන්තර හා තෙත් කලාපයේ පුද්ගලික බිම් කිහිපයකට පමණක් සීමා වුනු හොර ගසේ පාරිසරික වැදගත්කම ගැන අවබොධයක් ඇත්තේ අතලොස්සකට පමණි. එබැවින් කිසිවෙකු හොර ශාඛය තමන්ගේ වතු වල සිටු නොවන නමුත් අපගේ මුතුන් මිත්තන් රැකගෙන ආ ඉතුරු වී ඇති දැවැන්ත හොර ගස් පවා මුදලට කපා විකුණා දමති. හොර ශාඛයේ වැදගත්කම නොදත් ග්‍රාම නිලධාරී හා දිස්ත්‍රික් ලේඛම් කාර්යාල විසින් මෙම දැවැන්ත ආවේනික ගස් කැපීමට ඉඩදීම අප විසින් බදුල්ල දිස්ත්‍රික්කයේ විනාශ වී යන උඩකිරුව වැසි වනාන්තරයේ මෑතකදී කරන ලද ගවේෂණයකදී පැහැදිලිවම දක්නට ලැබුනි. මීටර් 60ක් පමණ උසැති ශ්‍රී ලංකාවේ ඇති ලෝකයේ උසම හොර ගස් මෙම උඩකිරුව ප්‍රදේශයේ හමුවන බව නොදත් බලධාරීන් මෙම වටිනා ගස් කපා දැමීමට අවසර දීම කනගාටුවකට කරුණකි.





( වඳවී යාමේ තර්ජනයට මුහුණ පා ඇති උඩකිරුව වැසි වනාන්තරයේ දැවැන්ත හොර ගස් )



( මෑතකදී උඩකිරුව වැසි වනාන්තරයේ කපා විකුණා ඇති හොර ගස් )

ඉහත කරුනු හේතුකොටගෙන පරිසර අමාත්‍යාංශය හා මධ්‍යම පරිසර අධිකාරිය එකතුවී හොර (*Dipterocarpus zeylanicus)* ශාඛය ආරක්ෂිත ශාඛයක් ලෙස කඩිනමින් නීති ගත නොකලහොත් එය සදහටම ශ්‍රී ලංකාවට හා ලෝකයට අහිමි වී යන දිනය වැඩි ඈතක නොවන බව තේරුම් ගත යුතුය. මෙම නීති ගත කිරීමට පසුව අදාල ප්‍රදේශවල ග්‍රාම නිලධාරී, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශිය ලේකම් හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් වහා දැනුවත් කිරීමක් කල යුතුය. මේ පිලිබඳව පරිසර අමාත්‍යාංශය හා මධ්‍යම පරිසර අධිකාරිය එකතුවී වහාම පියවර ගන්නා ලෙස අප කාරුණිකව ඉල්ලා සිටිමු.

**වැසි වනාන්තර සුරකින්නෝ**

**http://www.RainforestProtectors.org**

***1. Dipterocarpus zeylanicus (Wikipedia)***

*https://en.wikipedia.org/wiki/Dipterocarpus_zeylanicus*